# සිතුවම් කළ සිතියම : මහනුවර යුගයේ වත්තේගම රාජමහාවිහාරයේ පෙතිකඩ සිතුවම පිළිබඳ විමර්ශනයක්

මහාචාර්ය සුමනසිරි වාච්චගේ[1], ආචාර්ය දර්ශන බණ්ඩාර[2]

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ අගනගරය වන අනුරාධපුරය හා පොළොන්නරුව කේන්ද්‍රකරගෙන බිහි වූ රජරට ශිෂ්ටාචාරයේ සමාජ, ආර්ථීක හා සංස්කෘතික රටා වඩාත් ඔපවත් වූයේ බුදුසමයේ මුල් බැස ගැනීමත් සමඟ බව මූලාශ්‍ර අනුව පැහැදිලි වේ. බුදුදහමත් සමඟ මෙරටට හිමි වූ වාස්තුවිද්‍යාව, සිතුවම් කලාව, මූර්ති හා කැටයම් මෙන්ම විවිධ බෞද්ධ සංස්කෘතිකාංගයන් දේශීය සංස්කෘතියෙහි මූලික හර පද්ධතිය බවට පත් විය. බෞද්ධ සිතුවම් කලාව ද කාලානුරූපීව වෙනස් වෙමින් සංස්කෘතික යුග ගණනාවක ලක්ෂණයන් පෙන්වමින් සංවර්ධනය විය. මහනුවර යුගය මෙරට සිතුවම් කලාවෙහි වැදගත් කාල පරාසයක් සේම මෙම සමයෙහි අඳින ලද විහාර බිතුසිතුවම් වලින් සමකාලීන ඉතිහාසයේ විවිධ පැතිකඩ ද නිරූපනය වේ. අනුරාධපුර යුගයේ ප්‍රමුඛ උපරාජ්‍යයක් වූ රෝහණ දේශයේ විවිධ ප්‍රදේශවලින් මහනුවර රාජධානි සමයේ විහාර සිතුවම් හමුවන අතර මොනරාගල දිස්ත්‍රික්කයට එහි දී විශේෂ වැදගත්කමක් හිමි වේ. පැරණි රෝහණයට අයත් මොනරාගල, කොටියාගල ප්‍රදේශය ආසන්නයේ පිහිටි වත්තේගම රජමහා විහාරයෙන් හමු වූ පෙතිකඩ චිත්‍රයකින්,  පැරණි වත්තේගම විහාරයේ සැලැස්ම අඩංගු දුර්ලභ ගනයේ සිතියමක් හඳුනා ගැනීමට හැකිවිය.අතීතයේ දී මෙම විහාරයට පැමිණි බැතිමතුන්ට දැන ගැනීමට හා විහාරාරංග පහසුවෙන් හඳුනාගැනීමට මෙම සිතුවම සමකාලීනව උපයුක්ත කර ගන්නට ඇත. වත්තේගම රජමහා විහාර පරිශ්‍රයෙහි සිදුකළ ක්ෂේත්‍ර අධ්‍යයනයෙන් පැහැදිලි වූයේ මෙම විහාරය අනුරාධපුර හා මහනුවර යන යුගයන් දෙකෙහිදීම සංවර්ධනය වූ බවයි.මහනුවර රාජධානි සමයෙහි අඳින ලද සිතුවම් අතර ඇති පෙතිකඩ සිතුවම 18වන සියවසට අයත් යැයි අනුමාන කළ හැක. සිතුවම ඇඳ ඇත්තේවිදෙස් රටකින් ආනයනය කළ රෙදිකඩක විය හැකි බව උපකල්පනය කරන අතර මෙහි දිග අඩි08  හා පළල අඩි 04කි.18 වන සියවය වන විට මෙම විහාරයෙහි ස්වරූපය හා විහාර අංග සිතුවම් කිරීමට අමතරව මෙම ශිල්පියා විසින් ඒවා මෙනවාදැයි හඳුන්වාදීමට ද උත්සාහ දරා ඇත. මෙම සිතියම අධ්‍යයනය කිරීමෙන් සමකාලීන ඉතිහාසය හඳුනා ගැනීමටත් අදාළ යුගයේ තිබූ පුරාවස්තු හඳුනා ගැනීමට හා ඒවා

---

[1] පීඨාධිපති, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය

[2] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය

කාලය සමග විනාශ වූ අන්දම හඳුනා ගැනීමට අවස්ථාව හිමි වේ.මෙම අධ්‍යයනයේ දී විහාර සිතියමක් ලෙස සිතුවමක් හමුවන දුර්ලභ ස්ථානයක් වන වත්තේගම විහාරයෙහි පවතින ඓතිහාසික වැදගත්කම මෙම සිතුවම ඇසුරින් විමර්ශනය කිරීමට හැකිවිය.

## පර්යේෂණ අරමුණ හා වැදගත්කම

මෙම අධ්‍යයනය සිදුකිරීමේ මූලික අරමුණ බවට පත් වූයේ "දුර්ලභ ගනයේ යථොක්ත සිතියම් සිතුවම තුළින් වත්තේගම විහාරය මහනුවර රාජධානි සමයෙහි පැවති ස්වරූපය හඳුනාගැනීම" යි.එසේම සිතුවම තුළ අන්තර්ගතව ඇති ස්ථාන සංස්කෘතිකමය නිර්මාණයන් කොතෙක් දුරට නූතනය දක්වා ආරක්ෂා වී පවතී ද යන්න සොයාබැලීම ද තවත් පර්යේෂණ අරමුණකි. නූතනයේ දී වනගහනයට ලක් වී විනාශ වෙමින් පවතින මෙම විහාරයෙහි ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වටිනාකම තහවුරු කිරීමට මෙම සිතුවම උපයුක්ත කර ගත හැකි අන්දම විමර්ශනය කිරීමද මෙහි දී වැදගත් වේ.පැරණි රෝහණයේ අගනුවරින් ප්‍රත්‍යන්තව ග්‍රාමීය ප්‍රදේශයක පිහිටියා වූ වත්තේගම රජමහා විහාරයේ පෙතිකඩ සිතුවම විමර්ශනය කිරීම තුළින් සමකාලීන ආගමික හා සංස්කෘතික පරිසරය අවබෝධ කර ගැනීමට මනා පිටුවහලක් හිමි වේ.

## පර්යේෂණ ක්‍රමවේදය

වත්තේගම විහාර පෙතිකඩ සිතුවම විමර්ශනයේ දී ප්‍රධාන අධ්‍යයන ක්‍රමවේද ලෙස ක්ෂේත්‍ර පර්යේෂණ ක්‍රමවේදය හා පුස්තකාල අධ්‍යයනය භාවිතා කරන ලදී. ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී අදාළසිතියම මූලිකව පරීක්ෂා කිරීමෙන් හා එහි සඳහන් අකුරු කියවීමෙන් පසු සිතියමේ අඩංගුවන මූලිකාංග හඳුනාගෙන ඒවා අපගේ ක්ෂේත්‍ර පර්යේෂණයට යොදාගනු ලැබීය. සිතුවමෙහි සඳහන් අංගයන් වෙන් වෙන් වශයෙන් ගෙන අධ්‍යයනය කරමෙම අංගයන් වත්තේගම විහාර භූමියෙහි පවතී ද යන්න ගවේශනය කළ අතර ප්‍රදේශය ආශ්‍රිතව හමුවන මහනුවර යුගයේ සිතුවම් හා වෙනත් පරිශ්‍රයන් ද ගවේශනය කරන ලදී. එසේම මහනුවර යුගයෙහි පැවති අක්ෂර ශෛලීන් හඳුනාගැනීමට හා මෙම යුගයේ සිතුවම්වල පවත්නා විශේෂත්වයන් අවබෝධ කරගැනීම සඳහා පුස්තකාල ග්‍රන්ථ පරිශීලනයක් සිදුකරණු ලැබීය.

**සිතුවමෙහි අන්තර්ගතය**

මෙම සිතියම ඇඳ ඇත්තේ පෙතිකඩ චිත්‍ර ශෛලියට අනුව රෙදි කඩක වන අතර අදාළ චිත්‍රය සඳහා සෘජුකෝණාශ්‍රාකාර හැඩයෙන් රෙදිකඩක් සකස්කරගෙන ඇත. මෙම රෙදිකඩ විදේශයකින් ආනයනය කළ රෙදි වර්ගයකට අයත් වේ. සිතුවම ඇඳීමට පෙර අලංකාර මෝස්තරයකින් රෙදිකඩ වටා ප්‍රදේශය සිතුවම්කර ගෙන තිබේ. අළු, කහ, කොල, නිල් වර්ණ භාවිත කර ඇති අතර අඳින ලද සෑම වස්තුවක් වටාම කලු පැහැති සියුම් රේඛා දැකිය හැකි වේ. මෙම සිතුවමේ වම් ප්‍රදේශයේ හා දකුණු ප්‍රදේශයේ ගල් තලා දෙකක් දක්වා ඇති අතර මැද භාගයේ විහාරයේ ස්තූපය සිතුවම්කර තිබේ. වම් කෙලවරේ ඉහළ කොටසේ පිහිටි ගල් තලාව පාමුල ගල් ලෙනක් නිරූපනය වන අතර එහි ස්තූපයක් ඇඳ තිබේ. අදාළ ස්තූපය සකස් කිරීමට පෙර එම ස්ථානයේ දහඅට රියන් බුදු පිළිමයක් තිබූ බවට සිතුවම්කරු සඳහන් කර තිබීමෙන්ඔහුමෙම සිතුවම නිර්මාණයට පෙර යුගයේ විහාරයේ ස්වාභාවය පිළිබඳව ද විමසිලිමත් වූ බවක් පෙන්නුම් කරයි. නූතනයේ මෙම කුඩා ස්තූපය ද ගල් ලෙන තුළ දැකිය නොහැකිය. සිතුවමේ මැද භාගයේ පැරණි ගල් පේලියක් දක්වා මීට පෙර විහාරය(පළමු විහාරය) පිහිටි ස්ථානය ලෙස දැක්වීමෙන් ද ශිල්පියාගේ පුරාවස්තු පිළිබඳ දැක්ම පිළිබිඹු වේ. මෙම සිතියමේ වැඩි ඉඩක් ලබා දී ඇත්තේ ඉපැරණි ස්තූපයට වන අතර පෞරාණික රෝහණයේ මධ්‍යම ප්‍රමාණයේ ස්තූපයක් ලෙස එය නූතනයේ දී හඳුනාගත හැකි වේ. අදාළ ස්තූපය මේ වන විට ගරා වැටීමට ලක් වී තිබුනද මහනුවර යුගය වන විට ස්තූපය සියක් රියනක් පළලින්(බිම් සැළැස්ම) හා හැට රියනක් උසින් පැවති බව සිතියමින් හෙළි වේ. ස්තූපයේ පිහිටීම හා ස්වරූපය හඳුනා ගැනීමට ද අදාළ පෙතිකඩ චිත්‍රයෙහි දැක්වෙන සිතියම ප්‍රයෝජනවත් වේ. ස්තූපය වටා පිහිටි ගල් පඩිපේළි, විහාරයේ මාර්ග, පර්වත මුදුන්වල ඇති පොකුණු වලට කපන ලද පියගැට පේළි, ආදිය ද මෙම සිතුවමෙහි දැක්වේ. විහාරය ආසන්න වනය සහ එහි වසන කොටි, වල් ඌරන්, ඇතුන් පවා සිතුවම් කර තිබේ. තවද මෙම සිතුවම නිර්මාණය කරන සමයෙහි දෘශ්‍යමාන නොවූ ඇතැම් ස්ථානයන් නාමකරණයෙන් දක්වා ඇත. පැරණි විහාරයක අංග තේරුම් ගැනීමට හා මහනුවර යුගය වන විට වත්තේගම විහාරයේ පිහිටීම හා අදාළ පුරාවස්තුවල හැඩතල හඳුනාගැනීමට මෙම සිතියම ප්‍රයෝජනවත් වේ. විහාරයක සැළැස්මක් පිළිබිඹු කරන සිතියමක් අඩංගු පෙතිකඩ චිත්‍රයක් ලෙස වත්තේගම රජ මහා විහාරයේ පෙතිකඩ චිත්‍ර සිතුවම සුරක්ෂිත කිරීම කාලෝචිතය

## නිගමනය

ශ්‍රී ලංකා ඉතිහාසයේ යුගයන් ගණනාවක සංවර්ධනයට බඳුන් වූ මෙම විහාරය වර්තමානයේ විශාල වශයෙන් විනාශයට පත්ව ඇති අතර මෙම ස්ථානයෙහි ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක ස්වරූපය අවබෝධ කරගැනීම සඳහා මින් ලැබෙන පිටිවහල වැදගත් ය. එසේම පෙතිකඩ සිතුවම මගින් පූර්ව අවස්ථාවල දී මෙම පුරා පරිශ්‍රයේ පැවති දැනට මතුපිට විද්‍යාමාන නොවන ඇතැම් පුරාවස්තු හා ස්මාරක හඳුනාගැනීම සඳහා ද දායකත්වයක් සපයන අතර සිත්තරාගේ දැනුවත්භාවය හා ඓතිහාසික දැනුම මෙමගින් ප්‍රකට වේ. විහාරයෙහි එක් එක් අංගයන්ගේ පිහිටිම හඳුනාගැනීමේ දී සිතුවම වඩා වැදගත් අංගයකි. පරිමාණය පිළිබඳව එතරම් සැළකිල්ලක් ශිල්පියා දැක් වූ බවක් නොපෙනෙන අතර ඔහු ඒ ඒ අංගයන්ගේ පූජනීය වටිනාකම අනුව පරිමාණය සකසාගත් බව පැහැදිළිය.මෙම සිතුවමින් මහනුවර රාජධානි සමය වන විට විහාරයේ ස්වරූපය තත් කාලීන සංස්කෘතික හා පාරිසරික ස්වාභාවය නිරූපනය කර ඇති ආකාරය හඳුනාගත හැකි ය. අනාගතයේ මෙම පරිශ්‍රය ආශ්‍රිතව සිදුකරණු ලබන පුරාවිද්‍යාත්මක ගවේශන, කැණීම් හා සංරක්ෂණ වල දී මෙකී පෙතිකඩ සිතුවම මනා පිටුවහලක් කරගත හැකි අතර මෙම සිතුවම ආරක්ෂාකර ගැනීම වැදගත් වේ.

ප්‍රමුඛ පද : විහාර සිතියම, පෙතිකඩ චිත්‍ර, මහනුවර යුගයේ සිතුවම්, වත්තේගම රජමහා විහාරය

## ආශ්‍රිත ග්‍රන්ථ

*ඌව වංශ කථාව* (1 කාණ්ඩය). (1991). (සංස්) බණ්ඩාර, තිලකසිරි, ඌව පළාත් සහා සංස්කෘතික අමාත්‍යාංශය.

*ඌව වංශ කථාව* (2 කාණ්ඩය). (1991). (සංස්) බණ්ඩාර, තිලකසිරි, ඌව පළාත් සහා සංස්කෘතික අමාත්‍යාංශය.

*ඌව විහාර වංශය.* (1997). (සංස්.) බණ්ඩාර, තිලකසිරි, ඌව පළාත් සහා සංස්කෘතික අමාත්‍යාංශය.

*මහාවංශය.* (1996). සුමංගල හිමි, බටුවන්තුඩාවේ., දෙවරක්ෂිත පඬි, ඇස්., කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ.

කුමාරස්වාමි, ආනන්ද. (1994). *මධ්‍යකාලීන සිංහල කලා.* කොළඹ: ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව.

දේවරාජ, ශ්‍රීමතී. (1997). උඩරට රාජධානිය. කොළඹ: රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව.